## සංස්කෘතික පසුබිම

ඉතිහාසය හා පුරා විද්‍යාව යන විෂයයන්ගෙන් ලබාගත හැකි දැනුම පොදු ජනතාවගේ ඇසුරට පත් කිරීම හා ඓතිහාසික උරුමය පිළිබඳ දැනුම, සංවර්ධන කාර්යයේදී සෘජුවම දායක කර ගැනීම කෙරෙහි අවධානය යොමු කළයුතු වේ. ස්වදේශීය සම්ප්‍රදායන් හා තාක්ෂණයන් අප විසින් හඳුනාගත යුතු බව හා ආරක්ෂා කරගත යුතු බව අවබෝධ වීමෙන් ජනතාව සංවර්ධනයේ සක්‍රීය කොටස් කරුවන් වනු ඇත.ගම්පහ දිස්ත්‍රික්කයේ ආගමික පූජනීය ස්ථාන එනම් බෞද්ධ පන්සල්, ක්‍රිස්තියානි දේවස්ථාන හා මුස්ලිම් පල්ලි ඇතුළත් දිගු ඉතිහාසයක් හා සංස්කෘතික පෞඪත්වයකින් හෙබි ස්ථාන කිහිපයක් මෙහිදි සඳහන් කළ හැකිය.

මෙම ඓතිහාසිකව වැදගත් ස්ථාන හඳුනා ගැනීමේදි ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවට අනුබද්ධව ගම්පහ දිසා ලේකම් කාර්යාලයේ පිහිටුවා ඇති මාධ්‍ය ඒකකයේ ප්‍රකාශනය, සංස්කෘතික දෙපාර්තමේන්තුවේ " ගම්පහ දිස්ත්‍රික් සමාජ සංස්කෘතික සමීක්ෂා " හා ගම්පහ දිසාව සිරිසේන දේවප්‍රිය ග්‍රන්ථ ඇසුරු කළ බව ස්තුති පූර්වකව සඳහන් කරමු.

කැලණි නිම්නයේ පහළ කොටසත්, මධ්‍ය කොටසත් ඔස්සේ පැතිර යමින් කැලණි ගංගාවේ උතුරු ඉවුරේ ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් ජනාවාස රාශියක් තිබුණු බව පෙනේ. ප්‍රදේශය පුරා විසිරි ඇති පිළිකුත්තුව, මාළිගාතැන්න, සමනබැද්දේ පිහිටි ස්වභාවික ගුහා පද්ධතීන් අධ්‍යයනයට ලක් කිරීම සඳහා සැළකිය යුතු වැයමක මෙතෙක් යෙදි නැතත් ඒවා යේ මතුපිට අවශේෂ වලින් ප්‍රාග් ඓතිහාසික පැවැත්මත් පිළිබඳ සාධක ඉන් පිළිඹිබු වීමට ඉඩ ඇති බව මහාචාර්ය සේනක බණ්ඩාරනායක සහ රාජ්සෝමදේව ගම්පහ දිස්ත්‍රික් සමාජ සංස්කෘතික සමීක්ෂා ග්‍රන්ථයෙන් පෙන්වා දෙයි. උඩුගම්පොළට නුදුරු බෙම්මුල්ල, යකහටුව, යක්කල, යකුන්කෙළිය, නයිවල, නාලපහ, නාවාන වැනි ග්‍රාම නාම තුළින් ආදී යක්ෂ හා නාග ගෝත්‍රිකයන් මෙම ප්‍රදේශ වල ජනාවාස කරගෙන සිටි බව සිතිය හැකි යැයි විද්‍යාර්ථීන්ගේ මතය වේ. ශ්‍රී ලංකාවේ මුල් වරට යකඩ භාවිත කළ සංස්කෘතිය ලෙස මෙම ජනාවාස සැළකෙන බවත් කැලණිය රාජධානියට අයත් නාගරික හෝ පූර්ව නාගරික ලක්ෂණ පිළිබිඹු කරනවා විය හැකි බවත් වැඩි දුරටත් පෙන්වා දෙයි.

මුල් ඓතිහාසික යුගයට අයත් යැයි සැළකෙන කටාරම් කොටන ලද බෞද්ධ ලෙන් විහාරස්ථාන 19 ක් හඳුනාගත හැකිය. ඒවා මඩබාවිට, මැදගම, අලවල, අත්තනගල්ල, අලුතැපොල, අමුණගොඩ, වාරණ, ලින්දර, ඌරුවල, කොස්කඳවල, කහඳව, මාළදෙණිය, මාළිගාතැන්න, වැබොඩ, ලුණුගම, සමනළබැද්ද, පිළිකුත්තුව, අස්ගිරිය, තලගම ආදි වශයෙනි.

ගම්පහ දිස්ත්‍රික්කයේ පිහිටා ඇති බ්‍රාහ්මී ශිලා ලේඛන ප්‍රමාණය 8කි. (සමාජ සංස්කෘතික සමීක්ෂා - ගම්පහ දිස්ත්‍රික්කය) අනුරාධපුරයේ හා මිහින්තලයේ පැවතෙන්නාක් මෙන් ශ්‍රී ලංකාවේ මුල් වරට විහාරාරාම සැලසුම් හා උද්‍යාන කිහිපයක් ගම්පහ දිස්ත්‍රික්කය තුළ පිහිටා තිබුණේ යැයි ද ඒවා අතර කැපි පෙනෙන නිදර්ශන ලෙස මාළිගාතැන්න, වාරණ, පිළිකුත්තුව හා සමනබැද්ද දක්වා ඇත. මේවාට පර්වත ආශ්‍රිත ගොඩනැගිලි හා උද්‍යාන ඇතුළත් වු බව මහාචාර්ය සේනක බණ්ඩාරනායක සහ රාජ් සෝමදේව සමාජ සංස්කෘතික සමීක්ෂා වලින් පෙන්වා දෙයි.මුල් ඓතිහාසික යුගයට අයත් ගුහා විහාර හැරුණ විට 18 වන හා 19 වන සියවසේ නිර්මිත විශිෂ්ට දැවමය ගොඩනැගිලි සම්ප්‍රදායක් ගම්පහ දිස්ත්‍රික්කයේ පුරාණ වාස්තු විද්‍යාත්මක නිදර්ශන අතර කැපී පෙනේ.

ඒවා නම් ටැම්පිට විහාර හෝ දැවපිට විහාර යනුවෙන් හඳුන්වනු ලබන පිළිම ගෙවල් හා අම්බලම් ය. මහර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට අයත් අඹගස්පිටියේ ඇති ගල් කඩේ අම්බලම, ඇවරියවල අම්බලම නිදර්ශන වේ.

## සංස්කෘතික ස්ථාන

### කැලණි රජ මහා විහාරය







අනුරපුර යුගයට සමකාලීනව මායා රටේ අගනුවර ලෙස කැලණිය පැවැති බවත්, බුදුන් වහන්සේගේ දෙවන ලංකා ගමනේ දි කැලණියේ විසූ මණිඅක්ඛිත නා රජු බුද්ධ ධර්මය මනාව අවබෝධ කර ගැනීමට සමත් වීමත් ඓතිහාසික සිදු වීමකි. භික්ෂුන් වහන්සේලා 500 නමක් සමඟ තෙවන ලංකා ගමනේ දි බුද්ධත්වයෙන් 8 වෙනි අවුරුද්දේ දී කැලණියට වැඩම කළ බවත් අපේ වංශ කථා වල සඳහන් කරයි. ජීවමාන බුදුහු වැඩම කළ ස්ථානය ගම්පහ දිශාවේ පිහිටීම මහත් අභිමානයකි. එමෙන්ම මහින්දාගමනයට පෙර බුදුදහම කෙරෙහි පැහැදුන විශාල පිරිසක් සිටි බව ද මින් තහවුරු වේ. සියවස් කිහිපයක් තිස්සේ එනම් 1505 පෘතුග්‍රීසින්ගෙන් ද 1658 ලන්දේසින්ගෙන් ද අනතුරුව 1796 ඉංග්‍රීසින්ගෙන් ද බලපෑම් ඔස්සේ විජාතික ආක්‍රමණයන්ට මුහුණ දෙමින් විරාජමාණ කැලණි විහාරය ගම්පහ දිස්ත්‍රික්කයේ විහාරස්ථාන අතර මුදුන් මල්කඩ බඳු වේ. කෝට්ටේ රජ කළ 7 වන බුවනෙකබාහු මහ රජු කැලණිය උප රාජධානියට අයත් රජවාසලේ දී අන්තෝනියෝ ද බාසිලොස් නැමැති පෘතුග්‍රීසි සොල්දාදුවා විසින් වෙඩිතබා මරා දැමීම ඓතිහාසික සිදු වීමකි. කැලණි විහාරය හා විභීෂණ දේවාලය සිංහල සංදේශ කාව්‍යයන් හි වර්ණනාවට භාජනය වී ඇත.

පැලියගොඩ සිට නව නුවර පාර ඔස්සේ කි.මී. 9 ක් දුරින් කැලණි නදියට යා බඳව පිහිටා ඇති පුරාණ චෛත්‍ය චිත්‍රා බිතිසිතුවම් වලින් යුක්ත විහාරය හා දැවන්ත ගණ්ඨාර කුලුණ ඇතුළත් පැරණි නිර්මාණයන්ගෙන් සමන්විත වේ.

ඊට යාබද ව ඇති අලුත් විහාර මන්දිරය සෝලියස් මෙන්ඩිස් නම් කලාකරුවාගේ තෙළි තුඩින් නිමවුනු අළුත් කලා සම්ප්‍රදායන් ජනිත කර ඇත. පුරා වස්තු ප්‍රදර්ශනයට තබා ඇති කෞතුකාගාරයත් ඊට ආසන්නයේ ඇති සෙල්ලිපි 3 ත් වැදගත් වේ.

- **අස්ගිරිය පුරාණ ගල්ලෙන් රජ මහා විහාරය**



ගම්පහ මිනුවන්ගොඩ පාරට කි.මී. 2 ක් දුරින් ඇති දොරණාගොඩ පාරේ මීටර් 400 ක් ආසන්නයේ පිහිටා ඇත. ශෛලමය සමාධි පිළිමය හා බිතුසිතුවම් ඉහළ ඓතිහාසික වටිනාකමක් දරයි.

- **සපුගස්කන්ද පුරාණ රජ මහා විහාරය**

කිරිබත්ගොඩ මංසන්ධියේ සිට උඩුපිළ මාර්ගයේ කි.මී. 6 ක් පමණ දුරින් පිහිටා ඇත. මෙහි ඇති බුදුපිළිමය ඇතුළු මූර්ති හා ලියවැල් ද උළුවහු ආදියේ ඇති බලිරේඛා හා හැඩතල ශත වර්ෂ ගණනාවක් පැරණි බව අනාවරණය වේ.

- **පිළිකුත්තුව රජ මහා විහාරය**



මිරිස්වත්ත මංසන්ධියෙන් වතුරුගම පාරේ කි.මී. 4 ක් පමණ දුරින් පිහිටා ඇත. ශ්‍රී ලංකාවට ආවේනික වූ වෘක්ෂලතා ආදියෙන් සමන්විත අක්කර 200 ක පමණ වූ ගම් 6 කට මැදි වූ වනගත ප්‍රදේශයක් හා පුරාණ ගල්ලෙන් 99 ක් රජමහා විහාරයට අයත් වෙයි. මංපෙත්, ආරක්ෂක වැට, දියකඩිති හා දිය පිරුණු විල් සහිත වූ විහාරයකි. ක්‍රි. පූර්ව 3 වන සියවසේ සිට කරවන ලද පූර්ව බ්‍රාහ්මී අක්ෂර සහිත ලෙන් ලිපි ගම්පහ ප්‍රදේශයෙන් හමු වී ඇති පැරණිතම ලේඛන වේ. පෘතුගීසී, ඕලන්ද හා ඉංග්‍රීසී යුගවලට අයත් පුරාවස්තු හමුවෙන ලංකාවේ එකම ස්ථානය ලෙස ද පිළිකුත්තුව රජමහා විහාරය සැලකේ.

- **කොස්කඳවල රජ මහා විහාරය**



කොළඹ නුවර පාරේ යක්කල නගරයෙන් කිරිඳිවැල මාර්ගයේ කි.මී. 3 ක් දුරින් පිහිටා ඇති වටිනා ඓතිහාසික උරුමයකි.

- **මාළිගාතැන්න ලෙන් විහාරය හා වන අසපුව**



කොළඹ නුවර පාරේ මිරිස්වත්ත මංසන්ධියෙන් වතුරුගම පාරේ කි.මී. 8 ක් පමණ දුරින් පිහිටා ඇත. මුහුදු මට්ටමේ සිට අඩි 600 ක් පමණ උසකින් යුතු පර්වත කුටියේ අක්කර 50 ක පමණ විශාල ප්‍රදේශයක් මෙම අසපුවට අයත් වේ. ශ්‍රී දළදා වහන්සේ කලක් මෙහි ආරක්ෂා සහිතව වැඩ හිටුවා පුද සත්කාර කළ බව සඳහන් වේ.

- **අත්තනගල්ල රජ මහා විහාරය**




අතීත ශ්‍රීලංකාවේ කැලණියට ආසන්නව අතිශය ප්‍රසිද්ධියට පත් ප්‍රදේශය වූයේ අත්තනගල්ලය. අත්තනගල්ල හා සිරිසඟබෝ රාජ පුවත ක්‍රි.පූ. 236 සම්පව බැඳි පැවති පෞරාණික වෘත්තාන්තයකි. ක්‍රි.ව. 370 උපතිස්ස රජු විසින් කරවන ලදැයි සැලකෙන පස් මහල් ප්‍රාසාදයේ නටඹුන් ඇත. හත්පීකුච්ඡි විහාරය (ගල් පවුවෙහි ඇතාගේ කුස පිහිටි තැන) ක්‍රිස්තු පූර්ව යුගයට අයත් ලෙන් ලිපි ඇතුළු ශිලා පිළි 40 ක් පමණ ද ගල්ලෙන් 38 ක් ද ඇතුළු අක්කර 300 පමණ බිමක විසුරුණු නෂ්ඨාවශේෂයන්ගෙන් යුක්තය. මෙම බිමට සැතපුම් 3 ක් පමණ නිරිත දිගින් පිහිටි වාරණත් සැතපුම් 5 ක් පමණ නිරිත දිගින් පිහිටි පිළිකුත්තුවත් ක්‍රිස්තු පූර්ව යුගයට අයත් ලෙන් ලිපි සහිත ස්ථාන හෙයින් අත්තනගල්ල හුදකලා වූ ඓතිහාසික ස්ථානයක් නොවන බව තහවුරු වෙයි.

- **මිරිස්වත්ත ලෙන් විහාරය**

මහනුවර යුගයට අයත් බිතුසිතුවම් වලින් අලංකාර කරන ලද වාරණ ලෙන් විහාරයට ඉදිරියෙන් මිරිස්වත්ත ලෙන් විහාරය පිහිටා ඇත.

- **වාරණ රජමහා විහාරය**



කොළඹ නුවර පාරේ රදාවානට හැරෙන හන්දියෙන් ඕගොඩපොළ පාරේ කි.මී. 4 ක් පමණ දුරින් පිහිටි මෙහි වළගම්බා රජු කි.පු. 92 දී පැමිණි බව කියවෙන සෙල්ලිපියක් හා කටාරම් කෙටූ ලෙන් 11 ක් පිහිටා ඇත. සෙල් ලිපියට අනුව තිස්සදත්ත නම් ස්වාමින් වහන්සේට මෙය පිළිගන්වන ලද බවක් සඳහන් වේ. දෙවනපැතිස් රජ දවස මෙම විහාරය කරවූ බවට මහාවංශය සාක්ෂි දරයි. ඒ අනුව වසර 2000 කට අධික කාලයක් බෞද්ධ මධ්‍යස්ථානයක් ලෙස මෙම විහාරස්ථානය ප්‍රකට වූ බව සැලකිය හැකිය.

- **දෙමටදෙනි කන්ද වැම්පිට විහාරය**

පස්යාල නාඹුළුව පාරේ හමුවන විහාර ගෙයකි. මෙහි පැරණි විහාරයත් බෝධියත් පැරණි ධර්ම ශාලාවත් ඓතිහාසික වැදගත් කමක් දරයි.

- **වලගම්බා රජමහා විහාරය**

මිරිස්වත්ත සංසන්ධියෙන් වතුරුගම පාරේ කි. මී.5 ක් දුරින් පිහිටි මාළිගාතැන්න පුරාණ විහාරයට පසෙක පිහිටි ඓතිහාසික වටිනාකමකින් යුතු පුරාණ විහාරයකි.

- **තලගම රජමහා විහාරය**

වරකාපොල මීරිගම මාර්ගයේ කි.මී. 5 ක් දුරින් කඳු ගැටයක් මත පිහිටි මෙම ස්ථානයේ මහාචාර්ය පරණවිතානයන්ගේ මතය අනුව ක්‍රි.පු. 2 – 7 සියවස් වලට අයත් බ්‍රහ්මී අක්ෂර වලින් ලියා ඇති සෙල් ලිපියේ වහලුන් නිදහස් කිරීමක් සම්බන්ධව සඳහන් වන බව කියවේ. වසර 2300 කට වඩා ඉතිහාසයක් ඇති ස්ථානයකි.

- **කහඳව රජමහා විහාරය**

මීරිගම නගරයේ සිට මීගමු පාරේ අක්කර 25 ක් පමණ භූමි ප්‍රදේශයක පිහිටා ඇත. මෙම විහාරයේ සංඝාවාසය හා ධාතු මන්දිරය දේශිය ගෘහ නිර්මාණ ශිල්පයට අනුව ඉදි කරන ලද අනගි නිර්මාණයකි.

- **ඓතිහාසික දඩගමුව රජ මහා විහාරය**



කළගෙඩිහේන වේයන්ගොඩ පාරේ කි.මී. 2 ක් පමණ දුරින් පිහිටි මෙම විහාරස්ථානයේ පුරාණ වාස්තු විද්‍යාත්මක ලක්ෂණ වලින් හෙබි වටදාගෙය අනගි නිර්මාණයකි.

- **කැරගල පද්මාවති පිරිවෙන**

  කෝට්ටේ යුගයේ රචිත හංස සංදේශයේ එන උත්කර්ශවත් වර්ණනාවෙන් විස්තර වන කැරගල පද්මාවති පිරිවෙන කෝට්ටේ යුගයේ පැවති ඉතා උසස් ගණයේ සංඝාවාසයක් හා අධ්‍යාපන පීඨයක් ලෙස ප්‍රචලිතය.

- **රාගම තේවත්ත බැසිලිකාව**



කොළඹ මීගමුව පාරේ මහබාගේ හන්දියෙන් සැතපුම් 3½ ක් දුරින් ඇති රාගම මංසන්ධියේ සිට සැතපුම් 4 ක් දුරින් තේ වත්ත බැසිලිකාව පිහිටා තිබේ. ශ්‍රී ලංකාව දෙවන ලෝක සංග්‍රාමයට ගොදුරුව සිටි අවස්ථාවේ යුද්ධ විනාශයෙන් රට බේරා දෙන ලෙස ට හා ඒ වෙනුවෙන් බැසිලිකාවක් සාදා දෙන බවට කරන ලද බාරයක් ඔප්පු කිරීමක් ලෙස ප්‍රංශයේ ලූර්දු දේව මැදුරට සමාන ලෙස 1940 ගණන් වල ඉදිකිරීමේ කටයුතු ආරම්භ කර ඇත. රෝගීන් සුවපත් කරගැනීම හා වෙනත් ඉල්ලීම් දේව මෑණියන්ගේ පාමුල ඉල්ලා සිටීමත් එයින් බලාපොරොත්තු සඵල කර ගැනීමටත් විශාල දේව භක්තිකයින් පිරිසක් පුරුදුව සිටිති.

- **තිහාරිය මුස්ලිම් පල්ලිය**

  කොළඹ නුවර මාර්ගයේ තිහාරිය හන්දියේ සිට වාරණ දෙසට සැතපුම් භාගයක් පමණ යන විට තිහාරිය මුස්ලිම් පල්ලිය හමුවේ. කුමාරිමුල්ල, කහටෝවිට යන මුස්ලිම් දේවස්ථාන වලට සමගාමීව ඉදි වී ඇති තිහාරිය මුස්ලිම් පල්ලිය ඉස්ලාම් බැතිමතුන්ගේ විශේෂ ගෞරව භක්තියට පාත්‍රව ඇති ස්ථානයකි.

- **ශ්‍රී මුක්ත මාරි අම්මාන් කෝවිල - මීගමුව**

  මීගමුව නගරයේ සිට කි.මී. 1.5 ක් දුරින් වෙල්ලවීදියේ පිහිටි මෙම කෝවිල හින්දු සංස්කෘතිය විදහාපාන විශේෂ ස්ථානයකි. වාර්ෂිකව පැවැත්වෙන වෙල් උත්සවය උප සංස්කෘතික ඇදහිලි වත් පිළිවෙත් විදහාපාමින් ගම්පහ දිස්ත්‍රික්කයේ ජන සංකලනය පෙන්නුම් කරයි

- **බෝතලේ වලව්ව**



වරකාපොල මීරිගම මාර්ගයේ කිලෝමීටර් 5ක් දුරින් ප්‍රථම අග්‍රාමාත්‍ය ඩී.එස්. සේනානායක මහතාගේ නිවස බෝතලේ වලව්ව නමින් හැඳින්වේ. මහල් දෙකකින් යුක්ත වීම මැද මිදුලක් හා කාමර විශාල සංඛ්‍යාවකින් යුක්ත වීම මෙහි විශේෂතා වේ. වසර 100 වඩා පැරණි මෙම වලව්ව අක්කර 200 ක පමණ පොල් වගාවක් ඇති භූමි ප්‍රදේශයක පිහිටා ඇත.

- **හොරගොල්ල වලව්ව**



අත්තනගල්ල ප්‍රාදේශය ලේකම් කොට්ඨාසයට අයත්ව කොළඹ නුවර මාර්ගයේ කළගෙඩිහේන හා නිට්ටඹුව අතර හොරගොල්ල වලව්ව පිහිටා ඇත. දිවංගත අග්‍රාමාත්‍ය එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතා සහ ලෝකයේ ප්‍රථම අගමැතිණිය වන දිවංගත සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණියත් හොරගොල්ල වාසභූමිය කර ගත්හ. චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරණතුංග, අනුර බණ්ඩාරනායක වැනි දේශපාලන ක්ෂේත්‍රයේ විවිධ නායකයන් සම්බන්ධ ස්ථානයකි. පුරා විද්‍යාත්මක වැදගත් කමක් උසුලයි .

- **වත්තල තොටුපොල**

කොළඹ මීගමුව මහා මාර්ගයේ 5/6 සැතපුම් කණු අතරින් මායිම්වූ පෙදෙසයි. ලක්දිව උතුරු දෙසින් කොළඹ වරාය දක්වා තිබූ මාර්ගයත් සීතාවක දෙසින් පැමිණි මාර්ගයත් කැලණි ගඟ හරහා ගියේ වත්තල තොටුපලෙනි. එකල අරාබි වෙළඳුන් විසින් කොළඹ වරායෙන් යුරෝපයට ගෙනගිය කුළු බඩු කැලණි ගඟ හරහා ගෙන යන ලද්දේ මෙම තොටුපලෙනි. ශ්‍රී ලංකාවේ අවසන් රජු මෙරටින් පිටුවහල් කර ගෙන යන ලද්දේ ද වත්තල තොටුපලෙනි. ගල්වැටිය පාර ඒ අනුව ශ්‍රී වික්‍රම මාර්ගය ලෙස පළාත් සභාව මඟින් ද මට්ටක්කුලිය හරහා රජු ගිය පාර ශ්‍රී වික්‍රම මාවත ලෙසින් කොළඹ නගර සභාව විසින්ද නම් කර තිබේ.

- **හෙනරත්ගොඩ උද්භිද උද්‍යානය**



ගම්පහ නගරයේ සිට මිනුවන්ගොඩ මාර්ගයේ කි.මි. 1 ක් දුරින් පිහිටා ඇත. කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයට අයත් ලංකාවේ ඉතා වැදගත් උද්භිද උද්‍යාන අතරින් එකකි. එය හෙක්ටයාර් 14.4 ක (අක්කර 36) විශාලත්වයකින් යුක්ත ය. ශ්‍රී ලංකාවේ පැරණිතම රබර් ගස තිබූ උද්‍යානය ලෙස ප්‍රකට වෙයි. 1876 දී එංගලන්තයෙන් ගෙන් වූ මෙම රබර් පැළ පර්යේෂණ මට්ටමින් සිටවූ බවත් 1881 දී සාර්ථක ප්‍රතිපල ලබා ශ්‍රී ලංකාවේ පමණක් නොව බුරුමය, දකුණු ඉන්දියාව, මැලේසියාව වැනි රට වලට ද බීජ පැළ ව්‍යාප්ත කිරිමේ මහඟු සේවාවක් සිදු කළ ස්ථානය ලෙස හෙනරත්ගොඩ උද්භිද උද්‍යානය ජනාදරයට පාත්‍ර වේ. ශාක විශේෂ 450 ක් පමණ මෙහි දක්නට ලැබේ.

- **උඩුගම්පල**

වර්තමානයේ උඩුගම්පල ග්‍රාමීය ප්‍රදේශයකට සීමා වුවද පැරණි කෝට්ටේ යුගයේ දී උප රාජධානියක් ලෙස ප්‍රකට ය. කැලණි ගඟ, මා ඔය උතුර හා දකුණ දෙසින් ද බටහිරින් මහ සයුරත් නැගෙනහිරින් සබරගමුව හා බස්නාහිර පළාත් මායිම් කරන කඳු වැටියෙනුත් මෙම උප රාජධානියේ සතර මායිම් වූ බව සඳහන් වේ.

- **ඇතා උඩ කන්ද හා දේවිය පැන්න ඇල්ල**

ගම්පහ හා කෑගල්ල දිස්ත්‍රික්ක වලට මායිම්ව පිහිටා ඇති මෙම ස්ථානය අඩි 500ක් පමණ උස්වූ ගල් පර්වතයකි. නිවර්තන තෙත් සදාහරිත සණයට අයත් මෙම වන පියස තුළ පැරණි නටඹුන් දක්නට ඇත.

- **මුතුරාජවල තෙත්බිම**



ගම්පහ දිස්ත්‍රික්කයේ බටහිර වෙරළ තීරයේ කැලණි ගඟට උතුරින් මීගමුව කලපුව දක්වා මුතුරාජවෙල තෙත් බිම කි.මි. 30 ක් පමණ දුරින් විහිදී ඇත. ජා ඇල, වත්තල මීගමුව, කටාන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස ආශ්‍රිතව මුතුරාජවෙල වගුරු බිම අක්කර 6000ක පමණ ප්‍රදේශයක් ඇතුලත් වෙයි. එසේම වත්තල, මාබෝල, කෙරවලපිටිය, වැලිසර, කඳාන, වැලිගම්පිටිය, ජා ඇල, සීදූව යන ප්‍රදේශ මෙම වගුරු බිමේ සීමාවයි. අතීතයේ ද "මුතුරාජ වෙල්එළිය" ලෙසින්ද මුතු වැනි සහල් ලබා දුන් සරුසාර කුඹුරු යායක් ලෙස පැවතුන බව සඳහන් වේ. මුතුරාජවෙලින් වැඩි කොටසක් මුහුදු මට්ටමට පහළින් පිහිටා ඇත. මෙය මුහුදින් වෙන් වන්නේ සැතපුම් 25 ක් දිවෙන පටු වැලිපර බාධකයකිනි. ඕලන්ද ජාතිකයන් විසින් ඉදි කළ ජා ඇල, කොළඹ හා පුත්තලම දක්වා වෙරළට සමාන්තරව ඉදි කළ ඕලන්ද ඇළද ඉංග්‍රීසි ජාතිකයන් විසින් ඉදි කළ හැමිල්ටන් ඇළද මුතුරාජවෙල බැස්මට හරස්වන්න ඇතැයි සැලකේ. 1801 දී නිම කරන ලද හැමිල්ටන් ඇළ කොළඹ ආදායම් පාලක ලෙස සේවය කළ බ්‍රිතාන්‍ය ජාතික භාවින් හැමිල්ටන්ගේ උත්සාහයක ප්‍රතිඵලයකි. අධික ජෛව විවිධත්වයක් ඇති මෙම ප්‍රදේශය 1946 වසරේදී 947/13 දරණ ගැසට් පත්‍රය මගින් අභය භූමියක් ලෙස ප්‍රකාශිතය. බස්නාහිර පළාතේ ගං වතුර පාලනය සඳහා ඇති පළමු තෙත් බිම මෙයයි. මෙහි පදිංචි ජන කොටස් විවිධ ප්‍රදේශ වලින් සංක්‍රමණය වූ අනවසර පදිංචිකරුවන්ය. ඔවුන්ගෙන් මෙම පරිසරයට සිදුවන හානිය සුළු පටු නොවේ. පරිසරයට හිතකර ලෙස වගුරු බිම සංවර්ධනය කිරීමේ වගකීම ගැන සැලකිලිමත් වෙමින් මුතුරාජවෙල සංරක්ෂණය සඳහා විවිධ ව්‍යාපෘති රැසක් දැනටමත් අරඹා ඇති බවද මෙහි සඳහන් කල යුතුය .

- **යකා බැඳි ඇල්ල**

දඹදෙණි යුගයේ නිර්මාණය කරන්නට ඇතැයි සැලකෙන මීටර් 100ක් පමණ දිග මීටර් 4ක් පළල හා මීටර් 2ක් පමණ උස වූ දැවැන්ත වේල්ලක නටඹුන් කුරුණෑගල මිනුවන්ගොඩ මාර්ගයේ කි.මී. 35ක් දුරින් ඇති නාල්ල මංසන්ධියේ සිට කි.මී. 12ක් දුරින් දැකිය හැක.

- **පළඟතුරහ වෙරළ**

මීගමුව සංචාරක කර්මාන්තයට හා ධීවර කර්මාන්තයට යෝග්‍ය වූ සුවිශේෂ වෙරළ තීරයකි .

- **හැමිල්ටන් ඇල**



පුත්තලම සිට කොළඹ දක්වා දිවෙන හැමිල්ටන් ඇල (ඕලන්ද ඇල ලෙස ද හැඳින්වේ) ලන්දේසි යුගයේ ඉදිකරන ලද්දකි. ලන්දේසින් විසින් භාණ්ඩ ප්‍රවාහනය සඳහා මෙම ඇල භාවිතා කර ඇති අතර 1804 දී බ්‍රිතාන්‍යයන් විසින් නැවත ප්‍රතිසංස්කරනය කර, රාජ්‍ය ආදායම් හා වාණිජ කටයුතු නියෝජිත බ්‍රිතාන්‍ය ජාතික ගැවින් හැමිල්ටන් නමින් නම් කරන ලදී. අද වනවිට මෙය ධිවර යාත්‍රා නවතා තැබීම සඳහා භාවිතා කරයි.

- **බටළීය කජු ගම්මානය**

කොළඹ නුවර මාර්ගයේ පස්යාල දංඔවිට අතර කජුගම නමින් මෙම ගම්මානය පිහිටා ඇත. ගැමි ඇඳුමින් සැරසුනු කාන්තාවන් මෙම ගම්මානයේ මාර්ගය දෙපස කජු අලෙවිසැල් පවත්වාගෙන යති.

## Cultural Background

Attention should be focused on the knowledge that can be received from the subjects of history and archeology to connect to the public and to get the knowledge of the historical inheritance directly for the development process. The public will become active partners of the development process with the knowledge they acquire that we should identify and safeguard the indigenous traditions and techniques. Religious places found within Gampaha district with an arrogant cultural history that runs back to many years such as Buddhist temple, churches and mosques can be mentioned here.

It is with grateful thanks we mention here that when identifying these important historical places, we referred to statement of the media unit instituted at the district secretariat Gampaha affiliated to the department of news “Social Cultural Survey Book in Gampaha” of the department of cultural affairs and books of Sirisena Dewappriya.

It appears that there had been many colonies belonging to the prehistory period on the Northern riverbank at Kelani river spreading along the lower and central parts of the Kelani valley. Though there had not been considerable attempt to study the series of caves like natural caves in Pilikuththuwa, Maligathenna and Samanabadda spread around the area, Prof. Senaka Bandaranayake and Rajsomadewa has shown in ‘Samaja Sanskruthika Sameeksha’ in Gampaha district that the remains seen on the surface of these caves give evidence of the continuance of the prehistory.

It is the opinion of the scholars that tribesmen of the tribes “Yaksha” and “Maya” had made the areas Bemmulla, Yakahatuwa, Yakkala, Yakunheliya, Naiwala,

Nalapaha, and Nawana close to Udugampala, their colonies according to the names at the villages.

It has been further shown that these colonies are considered as the culture which has utilized iron for the first time in Sri Lanka and that it depicts urban or pre-urban characteristics of the Kelani territory. Nineteen Buddhist temples with carvings that are considered belonging to the pre-historic period can be identified. They are Madabawita, Medagama, Alawala, Attanagalla, Aluthapola, Amunugoda, Warana, Lindara, Uruwala, Koskandawala, Kahandawa, Maladeniya, Maligathenna, Weboda, Lunugama, Samanabedda, Pilikuttuwa, Asgiriya and Thalagama respectively.

There are eight Brahmin inscriptions in Gampaha District (Social Cultural Survey Book in Gampaha). It has been stated that there had been plans of temples and several gardens for the first time in Sri Lanka as in Anuradhapura and Mihinthala and that Maligathenna, Warana, Pilikuththuwa and Samanabedda some noticeable for them. Prof. Senaka Bandaranayaka and Raj Sumanadewa have shown in 'Social Cultural Survey Book in Gampaha' that these included buildings associated with rocks and gardens.

Apart from the cave temples that belong to the Pre-historical era, wooden buildings tradition relevant to 18th and 19th centuries are noticeable among the ancient architecture examples in Gampaha district. They are image houses and wayside rests known as Tampita Viharaya and Dawapita Viharaya. Galkade wayside rest and Awariyawala wayside rest in Ambagaspitiya are examples seen in Mahara Divisional Secretariat.

## Places of cultural importance

- **Kelani Raja Maha Viharaya**



The fact that Kelaniya had been the capital of Maha country contemporaneous to the Anuradhapura era and the fact that the snake king Maniakkitha who lived in Kelaniya was able to understand the Buddhism thoroughly during the second visit of Lord Buddha to Sri Lanka are considered as historical events. It has been mentioned in the legendry stories that Lord Buddha Kelaniya during his third visit to on the 8th year after enlightenment with 500 older Bhikkhus. It is a great pride that the place visited by the living Buddha is located within Gampaha. This also proves that there had been a large community who believed in Buddhism even before the visit of Mihidu thero. Kelaniya temple is the most prestigious among the temples in Gampaha district as it faced many invasions of invaders,

Portuguese in 1505, Dutch in 1618 and the British in 1796 thought out several centuries.

The fact that king Buwanekabahu the 7th who ruled Kotte was shot dead by a Portuguese soldier called Antonio Bacilos at the palace, which belonged to the Kelaniya sub-kingdom, is also an historical event. Kelaniya temple and the Vibheeshana Dewalaya had been criticized in many ways in Sinhala message poems.

The ancient stupa that located close to Kelani river 9.km away along the new Kandy road from Peliyagoda is with valuable paintings and a huge bell tower. The adjoining newly built temple depict the new generation of art by the artist Soliyas Mendis. The museums, which exhibit antiques and the close by three epigraphs, are also important.

- **Asgiriya ancient rock temple**



This is located about 400m from Doranagoda Road about 2km away from Gampaha Minnuwangoda road. The stone statue and the paintings found here historically valuable.

- **Sapugaskanda Purana Rajamaha Viharaya**

This is located about 6km from Udupilla road from Kiribathgoda junction. It has been revealed that statues of Buddha, Sculpture, decorative motifs, images and shapes in door frames are many centuries old.

- **Pilikuththuwa Raja Maha Viharaya**



This is located about 4km away along Wathurugama road from the Miriswatta junction. A forestry area about 200 acres surrounded by six villages made of flora hereditary to Sri Lanka and 99 ancient caves belong to this temple. Roads, security fences, small streams and ponds willed with water can be seen here. The older rock inscription found from Gampaha is the rock inscription with pre-brahmin letters, which has been done in 3rd century BC. Pilikuththuwa temple can be considered as the only place where antiques that belong to Portuguese Dutch and British era can found.

- **Koskandawala Raja Maha Viharaya**



This temple located about 3km on the Kirindiwela road from Yakkala town via Colombo Kandy road is of historical importance.

- **Maligathenna cave temple and Forest Hermitage**



This is located about 8 km away on the Wathurugama road from the Miriswatta junction along the Colombo Kandy road. This rock care is found at a height about 600 feet from the sea level and this heritage is located in a large area of about 50 acres. It has been mentioned that the tooth of relic had been safely placed and worshiped this place for some time.


- **Attanagalla Raja Maha Viharaya**

The area, which became most famous close to Kelaniya in the ancient Sri Lanka, is Attanagalla. Attanagalla and the story of king Sirisangabo, connected with 236AD is an old legend. There are rains of the five Story building said to be built by king Upatissa in 370AD. Hasthikuchchi Viharaya where the belly of the elephant is on the rock mountain is spread in a land of about 300 acres with rains spread around and about 40 stone inscriptions including cave inscriptions that belong to the period Before Christ and about 38 caves.



A s Varana, which is located about 3 miles in the South-Western province and Pilikuttuwa, which is located about 5 miles in the South-Western province are places with cave inscriptions belongings to the era Before Christ it shows that Attanagalla is not an isolated historical place.

- **Varana Raja Maha Viharaya**



In Varana Raja Maha Viharaya which is located about 4km on the Ogodapola and from the junction which turns to Radawana on the Colombo Kandy road, is a stone inscription which says that king Walagamba visited this place 92AC and 11 caves with carvings which have been dedicated to a monk called Tissadanta. Mahawansaya bear witness to the fact that this temple had been built at the time of king Devanampiyathissa accordingly it can be considered that this temple had been famous as a Buddhist culture for over 2000 year.

- **Miriswatta cave temple**

This is situated in front of the Varana cave temple, which has been decorated with paintings that belongs to Kandy period.

- **Dematapitikanda tampita temple**

This is found along the Pasyala Nittambuwa road the old temple the Bo tree and preaching hall bear historical importance.

- **Walagamba Raja Maha viharaya**

An ancient temple with historical importance located beside Miligatenna Purana Viharaya about 5 km away on the Wathurugama road from Miriswatta junction.

- **Thalagama Rajamaha viharaya**

This is located on a peak of a mountain about 5km away on the Warakapola Mirigama road according to the view of prof. Paranawithana the stone inscription written in Brahmi letters that belong to 2-7 centuries contains information regarding a release of some slaves.

- **Kahandawa Rajamaha viharaya**This is located on a land of about 25 acres on the Negambo road from Mirigama the Sangawasa and the relic chamber found in this temple are fabulous creations made using the local architecture.

- **Historical Dadagamuwa Rajamaha Viharaya**



This is located about 2 km away on the Kalagedihena Veyangoda road. The circular house found here is a marvelous creation made using ancient architecture.

- **Keragala Padmawathi Piriwena**

Padmawathi Piriwena, which has been criticized in the Hansa message poetry during Kotte period, is famous as a highly recognized Sangawasa and a collage of education.

- **Ragama Thewatta Basilica**



This is located about four miles from the Ragama junction, which is located at about 3 ½ miles from Mahabage junction in the Colombo Kandy road. The construction work of this basilica had started in 1940s to prove a vow made that a Basilica will be constructed if the country would be saved from the Second World War. This had been constructed somewhat similar to the Luther Church in France. Many people who have faith in God visit here to get their illnesses cured and to fulfill the expectations.

- **Sri Muktha Mari Amman Kovila**

This Kovil is located in the dam street about 1.5 km away from Negambo town and is a special place where a characteristic of Hindu culture is visible. The Wale festival, which is celebrated every year, which shows beliefs and customs of the Hindu sub-culture, is an example for the mixed races living in Gampaha.

- **Thihariya Muslim Musque**

This mosque is located about ½ miles to the side of Warana from Thihariya junction in the Colombo Kandy road. Thihariya Muslim Mosque, which has been constructed simultaneous to the Kumarimulla and Kahatowita Muslim mosque, is a mosque, which has been subjected to the report of Islamic devotees.

- **Bothale Walawwa**



The house of the first Prime Minister Mr. D. S. Senanayake situated 5 km from Warakapola-Mirigama road is known as Bothale Walawwa, Having two stories centre compounds and a considerable amount of rooms are major characteristics seen in these houses. This house, which is over 200 years, is situated in a land, which is about 200 acres.

- **Horagolla Walawwa**



Horagolla Walawwa is located in between Kalagedihena and Nittambuwa in the Colombo Kandy road, which belongs to Attanagalla Divisional Secretariat. Late Prime Minister S.W.R.D. Bandaranayaka and the first women Prime Minister in the world, Sirimawo Bandaranayaka, made Horagolla Walawwa there residence. This place is related to many political leaders such as Chandrika Bandaranayaka Kumaratunga and Anura Bandaranayaka.

- **Wattala Ferry**

This is the area margined by 6/5 mile post in the Colombo Negambo road. The road up to Colombo fort from the Northern port of the country and the road from Seethawaka crossed the Kelani river from the Wattala ferry. The spices taken to Europe by the Arabic Merchants through Colombo port were transported across Kelani river at that time. It is also through this ferry that the last king of Sri Lanka was named Sri Wickrama road by the urban council and the road through which the king went across Mattakkuliya was named as Sri Wicrama Mawatha by the Colombo urban council.

- **Udugampala**

Though Udugampala has been marginalized to a rural area today, it had been a sub- kingdom daring Kotte era. The 04 sides of this sub-kingdom is marginalized by Kelani river and Ma-Oya from North and South, by the ocean from the West and by the mountain range that marginalize Sabaragamuwa and Western provinces from the fast.

- **Henarathgoda botanical garden**



This is located about 1 km away in the Minuwangoda road from Gampaha town. This is one of the important botanical garden in Sri Lanka, which belongs to the Ministry of Agriculture and lands. This is about 14.4 hectares. (36 acres) This is famous as the garden with the oldest rubber tree in Sri Lanka. This rubber plants brought from England in 1876 had been planted on an experimental level and has shown good result in 1881 thereafter Henarathgoda botanical garden has done a tremendous service at the place which distributed seedlings to countries like Burma, South India, and Malaysia about 450 kinds of plants are found here.

- **Muthurajawela Wetland**



Muthurajawela Wetland is spread in an area about 30 km away upto the Negambo lagoon from North of Kelani river along the West coastal area of Gampaha district. About 6000 acres of area fall close to the Ja-Ela Wattala, Negambo and Katana divisional secretariats and also Wattala Mabole, Kerawalapitiya, Walisara, Kandana, Waligampitiya and Ja-Ela and Seeduwa areas are the margins of this wetland. This had been known as "Muthuraja weleliya" in the past and it had been a fertiled paddy field, which produced rice like pearls. A major part of Muthurajawela is situated below the sea level. This is separated from the sea by a narrow sand dune about 25 miles longer.

The Dutch canal built by the Dutch people parallel to the coastal area from Ja-ela, Colombo to Putlam and the Hamilton canal built by the British people must have resulted for the descend of Muthurajawela. The Hamilton canal constructed in 1801 is a result of the effort taken by the British person called Hawin Hamilton who served as the revenue controller of Colombo. This area with a biological difference had been named, as a sanctuary by Gazette notice No.947/13 in 1946 .This is the first weland available in the Western Province to control floods. People living here are unpermitted residents who have settled in

the area from different parts of the country. The damage caused to this area by this people is grave. It should be also mentioned that many projects have been already commented in order to conserve Muthurajawela paying attention to the important of developing the wetland in an environmental friendly manner.

- **Yaka Badi Ella**

Remains of a huge dam about 100 m. long 4m wide and 2 m high, which is considered, must have been built during the Dambadeni period can be seen 12 km away from the Nalla junction, which is about 35 km along the Kurunegala Minuwangoda road.

- **Ethaudakanda and Dewiya Penna Ella**

This place, which is located in the margins of Gampaha and Kegalle districts, is a rock mountain about 500 feet high. Old ruins can be seen within this tropical forest.

- **Palagathuranga werala**

This is a coastal area special for fishery and tourism in Negombo.

- **Hamilton canal**



The Hamilton Canal, which runs from Puttalam to Colombo, also known as Dutch canal, is being built during the Dutch era. This canal was used by the Dutch for transporting goods. In 1804, it has reconstructed by the British and named Gavin Hamilton, the British Government Agent of Revenue and Commerce. Currently it is used for the purpose of abandoning fishing vessels.

- **Bataleeya cashew village**

This village is located in between Pasyala and Danowita on the Colombo Kandy road and is known as "Kajugama" women dressed in traditional clothing sell cashew along the road in this village.